“අල්ලාහ්ගේ දූතයාණන් සමග එක්ව එකම භාජනයෙන් මම ස්නානය කරන්නෙකු වූයෙමි. අප දෙදෙනාම (ස්නානය අනිවාර්යය වූ) ජුනුබ් තත්ත්වයේ පසුවූයෙමු. එතුමා මට නියෝග කළ පරිදි මම වසා ගත්තෙමි. පසුව මම ඔසප් තත්ත්වයේ සිටියදීම මා සමග එතුමා පහස වින්දහ

දේව විශ්වාසීන්ගේ මෑණියක් වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී. “අල්ලාහ්ගේ දූතයාණන් සමග එක්ව එකම භාජනයෙන් මම ස්නානය කරන්නෙකු වූයෙමි. අප දෙදෙනාම (ස්නානය අනිවාර්යය වූ) ජුනුබ් තත්ත්වයේ පසුවූයෙමු. එතුමා මට නියෝග කළ
පරිදි මම වසා ගත්තෙමි. පසුව මම ඔසප් තත්ත්වයේ සිටියදීම මා සමග එතුමා පහස වින්දහ. එමෙන්ම එතුමා ඉඃතිකාෆ් හෙවත් මස්ජිදයේ රැඳී සිටියදී එතුමා එතුමාගේ හිස මා වෙත
හෙළි කරයි. මම ඔසප් තත්ත්වයේ සිටිය දී එය සෝදා හැරියෙමි.” [صحيح] [متفق عليه]

දේව විශ්වාසීන්ගේ මෑණියක් වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය අල්ලාහ්ගේ දූතයාණන් සමග වූ විශේෂිත අවස්ථාවන් ගැන තොරතුරු දන්වා සිටියාය. ඒ අතරින් ඇය ජනාබත් තත්ත්වයේ සිටිය දී සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් සමග එකම බඳුනක එකට ස්නානය කර සිටීම ද එකකි. ඇය ඔසප් තත්ත්වයේ සිටිය දී එතුමාණන් ඇය සමග පහස විඳින්නට අපේක්ෂා කළ විට ඇගේ ඉණ සිට දණහිස් දක්වා වූ ශරීර කොටස ආවරණය කර ගන්නා මෙන් නියෝග කළහ. පසුව සංසර්ගයේ නිරත වීමෙන් තොරව ඇය සමග පහස වින්දහ. සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් ඉඃතිකාෆ් හෙවත් මස්ජිදයේ රැඳී සිටියදී තම හිස ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය වෙත දිගු කරයි. එවිට ඇය නිවසේ ඔසප් තත්ත්වයේ පසුවූවාය.

https://sunnah.global/hadeeth/si/show/3476